අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතියේ අදියර 2 - 2020
-----------------------------------------------------------------

අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතියේ අධියර 2 හි 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය අතර 2016 නොවැම්බර් 17 දින එළඹි අංක එස්.එල්-පී 115 දරන ණය ගිවිසුමේ ව්‍යාපෘති සංදේශයේ 18 පරිච්ඡේදය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්ථා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්ථාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය
------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය, වර්තමානයේ ජලසම්පාදන අමාත්‍යංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ අනුරාධපුර දිස්ත්‍රික්කය තුල ජල සැපයුම් පද්ධතියක් ඉදිකිරීම තුලින් ආරක්ෂිත පානීය ජලය සැපයීම හා ජල සම්පාදන ආවරණ ප්‍රදේශය වැඩි කිරීමත්, එමඟින් ව්‍යාපෘති ප්‍රදේශයේ සෞඛ්‍ය තත්වය හා ජීවන පරිසරය වැඩි දියුණු කිරීම් වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 31,598 කට සමාන ජපාන යෙන් මිලියන 27,301 ක් සහ ඉන් රු.මිලියන 26,779 කට සමාන ජපාන යෙන් මිලියන 23,137 ක් ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිත ආයතනය විසින් මූල්‍යනය කිරීමට එකඟ වී තිබුණි. තවද, ව්‍යාපෘතියේ සම්පූර්ණ පිරිවැයෙන් රු.මිලියන 27,196 ට සමාන ජපන් යෙන් මිලියන 23,498 ක් ව්‍යාපෘතියේ කටයුතු සඳහා වෙන්කර ඇති අතර ඉතිරි රු.මිලියන 4,401 ට සමාන ජපන් යෙන් මිලියන 3,803 ක මුදල ව්‍යාපෘති අදියර I හි ක්‍රියාකාරකම් සඳහා වෙන්කර ඇත. ව්‍යාපෘතිය යටතේ වූ ක්‍රියාකාරකම් 2017 ජූනි මාසයේදී ආරම්භ කර තිබූ අතර 2024 ජූනි වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 තත්වාගනනය කළ මතය
---------------------------------

මෙම වාර්තාවේ 2.1 වගුවේ විස්තර කර ඇති කරුණු වල බලපෑම හැර ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනට මේ සමඟ වූ මූල්‍ය ප්‍රකාශයන් මඟින් මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම
---------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු | වටිනාකම රු.මිලියන | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්ථා වලට අනුව, 2020 දෙසැම්බර් 31 දක්වා විදේශ මුදල් හුවමාරු කිරීම් මත විනිමය ලාභය රුපියල් මිලියන 6.15 ක් වූ අතර එය විශේෂ යෙන් ගිණුමේ ශේෂය ලෙස පෙන්වීම වෙනුවට කෙරීගෙන යන වැඩ ගිණුම තුළ වැරදියට පෙන්වා තිබීම. තවද, ඉහත ගණුදෙනු සත්‍යාපනය කිරීම සඳහා ව්‍යාපෘතියේ විශේෂ යෙන් ගිණුමේ මාසික බැංකු ප්‍රකාශණ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 6.15 | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් යාවත්කාලීන කරන ලද වියපැහැදම් වාර්ථාව අනුව සෑම බිල්පතකම විනිමය ලාභ/අලාභ ඇත. වත්මන් පරිචය හා මාර්ගෝපදේශය අනුව මෙම ශේෂය ව්‍යාපෘතියේ කෙරීගෙන යන වැඩ ගිණුමට ගනු ලැබේ. | අඩුපාඩුව නිවැරදි කිරීමට පියවර ගත යුතුය. |

## 3 භෞතික කාර්ය සාධනය

### 3.1 භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සංරචක 12 කින් සමන්විත වන අතර එහි කටයුතු 2017 ජූනි මාසයේදී ආරම්භ කරන ලදී. ඉන් 2020 දෙසැම්බර් 31 දිනට ප්‍රදානය කර තිබුණේ සවිස්තරාත්මක සැලසුම්කරණය හා ප්‍රසම්පාදන සහාය සඳහා වන උපදේශණ කොන්ත්‍රාත්තුව හා ඩබල් කැබ් රථ 2 ක් මිලදී ගැනීම් කොන්ත්‍රාත්තුව පමණි. එබැවින් 2020 දෙසැම්බර් 31 දින දක්වා ව්‍යාපෘතියේ සැලකිය යුතු භෞතික ප්‍රගතියක් පෙන්නුම් කර නොතිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්තු ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රගතිය පහත පරිදි වේ.

| අංකය | ව්‍යාපෘති සංරචකය / කොන්ත්‍රාත්තුව | 2020 දෙසැම්බර් 31 දිනට නියමිත ක්‍රියාකාරකම් | නියමිත කාල පරිච්ඡේදය | 2020 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|---|
| (අ) | ජල තුළුමුව පහසුකම්, ජල පවිත්‍රාගාරය, ජල ගබඩා, යාන්ත්‍රික විදුලි | ටෙන්ඩර් ලේඛනය සහ ලංසු කැඳවීම | 2020 නොවැම්බර් මාසය - 2021 | 2021 ජූලි 30 වන විටත් සම්පූර්ණ කර | කොන්ත්‍රාත්තුන් සහ ව්‍යාපෘතිය අවසන් කිරීම | ජල මූලාශ්‍රය වෙනස් වීම හේතුවෙන් ලංසු ලේඛනය සකස් කිරීම | ප්‍රසම්පාදන සැලැස්මට අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කර අවසන් |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | හා ගොඩනැගිලි වැඩ ඉදිකිරීම - කැබලි අක්ෂර - අ | සඳහා ජපන් සහයෝගිතා ආයතනයේ එකඟතාවය | මාර්තු | නොමැත. | ප්‍රමාද වීමේ හැකයාව | ප්‍රමාද විය. කොවිඩ් -19 සීමා කිරීම් සහ සීමිත ශ්‍රම බලකායක් හේතුවෙන් 2021 මැයි - ජූලි කාල සීමාව තුළ ප්‍රසම්පාදනය ප්‍රමාද විය. | කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | මෘදු යකඩ (DI) හා අධි තාක්ෂණික පොලි එතලින් (HDPE) ප්‍රධාන සම්ප්‍රේෂණ හා ප්‍රධාන බෙදාහැරීම් නල සැපයීම හා ඇතිරීම - කැබලි අක්ෂර බී. | ලංසු කැඳවීම | 2020 දෙසැම්බර් - 2021 පෙබරවාරි | 2021 අගෝස්තු 18 දින ලංසු කැඳවා ඇත. | කොන්ත්‍රාත්තුන් හා ව්‍යාපෘතිය අවසන් කිරීම ප්‍රමාද වීමේ හැකියාව | 2020.09.08 දින තාක්ෂණික ඇගයීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී. 2021 මැයි - ජූලි කාලසීමාව තුළ කොවිඩ්-19 සීමාකිරීම් සහ සීමිත ශ්‍රම බලකාය හේතුවෙන් ජපන් සහයෝගීතා ආයතනයේ එකඟතාවය ප්‍රමාද විය. | ප්‍රසම්පාදන සැලැස්මට අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කර අවසන් කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | අධි තාක්ෂණික පොලි එතලින්, මෘදු යකඩ ප්‍රධාන බෙදාහැරීම් නල සැපයීම හා ඇතිරීම සහ පදවිය හා කැබතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සඳහා සේවා සම්බන්ධතා සැපයීම කැබලි අක්ෂර සී 1 | ලංසු කැඳවීම හා ලංසු අවසන් කිරීම | 2020 නොවැම්බර් - 2021 ජනවාරි | 2021 ජූලි 21 දින ලංසු කැඳවා ඇත. | කොන්ත්‍රාත්තුන් හා ව්‍යාපෘතිය අවසන් කිරීම ප්‍රමාද වීමේ හැකියාව | කොවිඩ්-19 සීමා කිරීම් හා ශ්‍රම බලකායේ සීමාවන් හේතුවෙනි. | ප්‍රසම්පාදන සැලැස්මට අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කර අවසන් කිරීමට පියවර ගත යුතුය. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (ඈ) | අධි තාක්ෂණික පොලි එතලින් ප්‍රධාන බෙදාහැරීම් නල සැපයීම හා ඇතිරීම සහ කහටගස්දිගිලිය, හොරොව්පොතාන හා රබෑව ප්‍රදේශීය ලේකම් කොට්ඨාස සඳහා සේවා සබඳතා සැපයීම - කැබලි අක්ෂර සී 2 | ලංසු කැඳවීම හා ලංසු අවසන් කිරීම | 2020 දෙසැම්බර් - 2021 මාර්තු | 2021 ජූලි 28 දින ලංසු කැඳවා ඇත. | කොන්ත්‍රාත්තුන් හා ව්‍යාපෘතිය අවසන් කිරීම ප්‍රමාද වීමේ හැකියාව | කොවිඩ් 19 සීමා කිරීම් හේතුවෙන් තාක්ෂණික ඇගයීම් කමිටුවේ, අමාත්‍ය මණ්ඩලය පත්කළ විශේෂ ප්‍රසම්පාදන කමිටුවේ, අමාත්‍ය මණ්ඩලය පත්කළ උපදේශණ ප්‍රසම්පාදන කමිටුවේ හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා ජපන් සහයෝගීතා ආයතනයේ අනුමැතීන් ලබාගැනීම සඳහා බලාපොරොත්තු වූවාට වඩා වැඩි කාලයක් ගත විය. | ප්‍රසම්පාදන සැලැස්මට අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කර අවසන් කිරීමට පියවර ගත යුතුය. |
| (ඉ) | අධිතාක්ෂණික පොලි එතලින් බෙදාහැරීම් නල සැපයීම හා ඇතිරීම, සේවා සබඳතා සැපයීම හා 250 ක ධාරිතාවයකින් යුතු ජල කුළුණක් ඉදිකිරීම. - කැබලි අක්ෂර සී 3 (අදියර - 1 සඳහා) | 2020 දී සැලසුම් කර නැත. | _ | _ | කොන්ත්‍රාත්තුන් සහ ව්‍යාපෘතිය අවසන් කිරීම ප්‍රමාද වීමේ හැකියාව | කැබලි අක්ෂර සී 3 නව පැකේජය අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය අදියර II හි විෂය පථයට ඇතුලත් කර ඇත. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීමට සහ කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |
| (ඊ) | ඉදිකිරීම් අධීක්ෂණය සඳහා වන උපදේශණ | යෝජනාව සඳහා ඉල්ලීම කැඳවීම | 2020 දෙසැම්බර් | යෝජනාව සඳහා ඉල්ලීම | ඉදිකිරීම් අධීක්ෂණය සඳහා වන | ආරාධනා ලිපිය සහ යෝජනාව සඳහා | ප්‍රසම්පාදන සැලැස්මට අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| සේවාව - කැබලි අක්ෂර-එල් | හා අවසන් කිරීම. | මාසය 2021 ජනවාරි | 2021 ජූලි 14 දින කැඳවීම | උපදේශණ සේවා ප්‍රසම්පාදනය ප්‍රමාද වීමේ හැකියාව | ඉල්ලීම ලැයිස්තුගත උපදේශකයින් වෙත 2021 ජූලි 14 දින නිකුත් කරන ලදී. | ක්‍රියාත්මක කර අවසන් කිරීමට පියවර ගත යුතුය. |

**3.2** කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ සවිස්තරාත්මක සැලසුම්කරණය හා ප්‍රසම්පාදන සහාය සඳහා වූ උපදේශණ කොන්ත්‍රාත්තුවේ කාලසීමාව 2021 අගෝස්තු 31 දිනෙන් අවසන් වුවද, ඉදිකිරීම් කොන්ත්‍රාත්තු 12 න් කොන්ත්‍රාත්තු 10 ක්ම කල් ඉකුත් වන දිනය වන 2021 අගෝස්තු 31 දින දක්වා ප්‍රදානය කර නොතිබුණි. | ජල මූලාශ්‍රය වාහල්කඩ සිට යාන් ඔය දක්වා වෙනස්වීම සහ ඉරිදා පාස්කු ත්‍රස්ත ප්‍රහාරය හේතුවෙන් අනපේක්ෂිත ලෙස සමස්ථ ප්‍රගතියේ ප්‍රමාදයක් ඇති විය. | සංශෝධිත කොන්ත්‍රාත් කාලය තුළ උපදේශණ කටයුතු කඩිනම් කර අවසන් කිරීමට උපදෙස් දිය යුතුය. |
| (ආ) | මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා උපදේශණ කොන්ත්‍රාත්තුව යටතේ රුපියල් මිලියන 4 ක මුදලක් වෙන්කර තිබුණද, එවැනි මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් හා සම්මන්ත්‍රණ පවත්වා නොතිබුණි. | රට කොවිඩ්-19 රැලිවල බලපෑමට ලක්වීම හේතුවෙන් අප සැලසුම් කළ පරිදි වැඩසටහන් සකස් කිරීමට අපට නොහැකි විය. | කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට සහ ඉදිකිරීම් ආරම්භ කිරීමට පෙර මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට කටයුතු කළ යුතුය. |

**3.3** මතභේදයට තුඩු දෙන කරුණු

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘති අදියර II යටතේ, ජනතාව අනාරක්ෂිත භූගත ජලයෙන් යැපෙන සහ නිදන්ගත වකුගඩු රෝග පැතිර යන ප්‍රදේශ වන කැබතිගොල්ලෑව, පදවිය, හොරොව්පොතාන සහ කහටගස්දිගිලිය යන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ ආවරණය වේ. එබැවින් මෙම ජල සම්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට රජය ප්‍රමුඛත්වය දී ඇත. කෙසේ වෙතත්, කොන්ත්‍රාත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රසම්පාදන සැලැස්මට අනුකූල නොවීය. එහි ප්‍රතිඵලයක් ලෙස, සංශෝධිත ව්‍යාපෘති කාල සීමාව තුළ ව්‍යාපෘතිය නිම කිරීම සැක සහිත බව නිරීක්ෂණය විය. | ජල මූලාශ්‍රවල වෙනස්වීම් සහ කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් සැලකිය යුතු කාලයක් ගතවිය. නමුත් අපි දැඩි විශ්වාසයකින් සිටින අතර සම්පූර්ණ ව්‍යාපෘතිය සාක්ෂාත් කර ගැනීම සඳහා අපගේ උපරිම දායකත්වය ලබාදීමට උත්සාහ කරමු. | නියමිත කාලසීමාව තුළ ව්‍යාපෘතිය අවසන් කිරීමට සහ ව්‍යාපෘතියේ කටයුතු සමීපව නිරීක්ෂණය කිරීමට විශේෂ අවධානය යොමු කළ යුතුය. |

**3.4 පද්ධති හා පාලනයන්**

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | වර්ෂය සඳහා විදේශ අරමුදල් වෙන්කිරීම රුපියල් මිලියන **123.05** ක් වුවද, සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන **171.21** ක් වැය වී ඇති බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස විදේශ අරමුදල් ප්‍රතිපාදන ඉක්මවා රුපියල් මිලියන **48.16** ක මුදලක් වැය වී ඇත. | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් **2020** වර්ෂය සඳහා පුරෝකථනය කළ මුදල රු.මිලියන **208.63** කි. **2020** වසර සඳහා භාණ්ඩාගාරයෙන් ලබාදී ඇති ප්‍රතිපාදන රු.මිලියන **123.05** කි. භාණ්ඩාගාරයෙන් වෙන්කිරීම ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පාලනයෙන් ඔබ්බටය. | මෙම ජල සම්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට රජය ප්‍රමුඛත්වය දී ඇති බැවින් අවශ්‍ය මුදල් ප්‍රතිපාදන ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ **2010** ජූලි **26** දිනැති අංක **05** දරණ චක්‍රලේඛය ප්‍රකාරව ව්‍යාපෘතියේ ගනුදෙණු ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණනයට ලක් වී නොතිබුණි. | **2020** වර්ෂයේ අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය අදියර II සඳහා අභ්‍යන්තර විගණනයක් සිදු කර නොමැත. | අභ්‍යන්තර විගණනයක් සිදුකිරීමට පියවර ගත යුතුය. |